# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,126 - 2019 මැයි මස 31 වැනි සිකුරාදා - 2019.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 348 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 349 |


*සැ. යු.* - (i) ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2019 මැයි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2019 මැයි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජුනි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජුනි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මීගමුව දිසා අධිකරණයේ දී ය

මනික්කුගේ චන්ද්‍රිකා මල්කාන්ති සිල්වා, අංක 30/1, ශ්‍රමදාන මාවත, ඒත්තුකාල, මීගමුව.

*නඩු අංකය :* 3582/උකස් ................................*පැමිණිලිකාරිය.*

*එදිරිව*

මදුරගේ රනිතා චතුරාණි ප්‍රනාන්දු,
අංක 759/1, මැදපිටිපන,
මීගමුව.

.................................*විත්තිකාරිය.*

ඉහත අංක දරන නඩුවේ 2016.05.09 දිනැති සමථ තීන්දු ප්‍රකාශය මඟින් රුපියල් නව ලක්ෂ පනස් දහසක (රු. 950,000)ක මුදලක් හා ඒ මත 2014.05.28 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා නෛතික පොළියද, ඊට පසු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තුරු ඒ මත නෛතික පොළිය සහ ව්‍යවස්ථාපිත ගාස්තුව ද සමඟ පැමිණිලිකාරියට අයකර ගැනීමට ආඥාකොට ඇති බැවින් ද,

විත්තිකාරිය විසින් සමථ කොන්දේසි කඩකරමින් පැමිණිලිකාරිය වෙත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, රුපියල් අනූ දහසක් (90,000/-) පමණක් ගෙවා ඇති බැවින් ද, විත්තිකාරියට විරුද්ධව ඇස්කීසි නිකුත් කිරීමට ඉල්ලා ඇති බැවින් ද, 2018.09.22 දිනැති අධිකාරී පත්‍රය යටතේ පහත සඳහන් උපලේඛනයේ දේපළ විකිණීමට විධාන කර ඇති බැවින් ද,

මුදල විත්තිකාරියගෙන් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එකී ඉහත විස්තර කර ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම් පරවශ්‍යතා සහ අනුබද්ධිකයන් ද, විත්තිකාරියගෙන් කවර ආකාරයෙන් හෝ සියලුම අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙන් උපදන සහ එකතුවන සියලු කුළී ලාභ සහ අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ එකී රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති එකී දේපළ නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කීසි කළ හැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද,

එකී මුදල අයකර ගැනීම සඳහා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

වර්ෂ 2019ක් වූ ජුනි මස 17 වැනි දින පෙ. ව. 11.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී වෙන්දේසියේ ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් අළුත්කුරු කෝරළයේ දූනගහ පත්තුවේ මීගමුව මහ නගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිටිපන ග්‍රාම නිලධාරී වසමේ පිටිපන යන ගමෙහි පිහිටි ''කොට්ටන්ගහවත්ත'' නැමැති ඉඩමෙන් ඒ. සී. එස්. ගුණරත්න බලයලත් මානක තැන විසින් 1971.12.07 වැනි දින මැන සාදන ලද අංක 6183 දරන පිඹුරේ ප්‍රකාර බෙදූ ලොට් අක්ෂර ඒ දරන කොටස වන,

| | | |
|---|---|---|
| උතුරට | : | පී. මාර්ෂල් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, |
| නැගෙනහිරට | : | ලොට් අක්ෂර බී දරන ගුරුබැබිලගේ එලිසබෙත් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, |
| දකුණට | : | 1965.05.29 දිනැති අංක 4818 දරන පිඹුරේ නිරූපිත බී බෙනඩික් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, |
| බස්නාහිරට | : | බී. ජුස්ටිනා හාමිට අයිති ඉඩම ද, |

මායිම් වන පර්චස් විසි දෙකකුත් දශම පහක් විශාල ඉඩමෙන් නොබෙදූ දකුණු පැත්තේ පර්චස් එකොළහකුත් දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 11.25)ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් වේ.

මෙය මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී 730/157 හි ලියාපදිංචි වී ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්,
මීගමුව දිසා අධිකරණය.

වර්ෂ 2019 ක් වූ මැයි මස 22 වැනි දින දී ය.

05-972

## විවිධ දැන්වීම්

### කොළඹ දී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය)

*නඩු අංකය* : එච්. සී. (සිවිල්)/17/19/CO.
*ස්වභාවය* : ඈවර කිරීම
*වටිනාකම* : රු. 191,970,690.20
*පටිපාටිය* : ලඝු

දෙකටන, කටුලන්ද, නාරම්පොල පාර, අංක. 32 හි මවුන්ට් පැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් වූ ඉල්ලීමකි.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ්,
ලියාපදිංචි කාර්යාලය, අංක. 100/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

*ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :*

අංක. 504, නාවල පාර, රාජගිරිය.

................................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, නාවල පාර, අංක 504 යන ලිපිනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1, යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ් සමාගම විසින් වර්ෂ 2019 ක් වූ මාර්තු මස 29 වන දින වාණිජ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 09 වන දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළ කර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේදී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ :- සී. එම්. ජයරත්න,
අංක. 22, ෂේඩි ග්‍රෝව් ඇවිනියු,
කොළඹ 08.

*සටහන :* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේදී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් සී. එම්. ජයරත්න වෙත ගෙනැවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 08 වන දින පස්වරු 6.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතුය. *නැතහොත්* එපරිදි තැපෑලෙන් එවිය යුතුය.

සී. එම්. ජයරත්න.
අංක. 22, ෂේඩි ග්‍රෝව් ඇවනියු,
කොළඹ 08.

05-847

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

*නඩු අංකය* : HC (Civil) 21/2019/CO.
*ස්වභාවය* : සමාගම්
*කාර්ය පටිපාටිය* : ලඝු

ශ්‍රී ලංකාව, කොළඹ 03, ශාන්ත මයිකල්ස් පාර, අංක 18 දරන ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටි වෝල්කර්ස් පයිලිං (ප්‍රයිවට්) ලිමිටඩ් ඈවර කිරීම සඳහා කරනු ලබන කාරණයේ දී ය.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටසේ 270(e) සහ 270 (f) වගන්ති ප්‍රකාරව අධිකරණය මගින් ඈවරකරවා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

ටෝකියෝ සුපර්මික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 469 1/1,
ගාලු පාර, කොළඹ 03,
ශ්‍රී ලංකාව.

.................................*පෙත්සම්කරු.*

කොළඹ 03, ශාන්ත මයිකල්ස් පාර අංක 18 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි වෝල්කර්ස් පයිලිං (ප්‍රයිවට්) ලිමිටඩ් අංකය (PV5815) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2019 අප්‍රේල් මස 05 දින දරන පෙත්සමක් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත් කොට ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම 2019 ජූලි මස 01 වැනි දිනට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේදී පෞද්ගලිකව හෝ ලේඛනගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණයහිමියෙකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥ තැනගෙන් ඉල්ලා සිටි විට ලබා ගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ :* නීතිඥ මාලා සෙල්වරත්නම් මිය,
අංක 41, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන.-* මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේදී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ මාලා සෙල්වරත්නම් මිය වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද සමාගමක් වේ නම් සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර 2019.06.28 වන දින පස්වරු 3.00ට පෙර බාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥ තැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

මාලා සෙල්වරත්නම්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

05-893

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.